## 2025-02-24 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ

### 01. කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ කාලය දීර්ඝ කිරීම

ව්‍යාපෘති අධීක්ෂණය, ගැටලු විසඳීම සහ උපයෝගී සේවා සම්බන්ධීකරණය සඳහා ශ්‍රී ලංකා රජය සහ CHEC Port City Colombo (Pvt) Ltd සම්බන්ධ කරන ප්‍රධානතම ඒකකය ලෙස කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය කටයුතු කරනු ලබයි. මෙම ව්‍යාපෘතියේ දෙවන අදියර යටතේ සැලසුම් කර ඇති කාර්යයන් 2027 ජූනි මාසය වන විට අවසන් කිරීමට අපේක්ෂිතය. එබැවින්, කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මගින් සිදු කරනු ලබන අධීක්ෂණ හා සම්බන්ධීකරණ කාර්යයන් අඛණ්ඩව තවදුරටත් සිදු කළ යුතු බව හඳුනාගෙන ඇත. ඒ අනුව, එකී ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ මෙහෙයුම් කාලය 2027-06-05 දින දක්වා දීර්ඝ කිරීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

### 02. බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රික පුහුණු ආයතනය (BIDTI) සහ පිලිපීන ජනරජයේ විදේශ සේවා ආයතනය (FSI) අතර අවබෝධතා ගිවිසුම

දෙරට අතර මිත්‍රත්වය සහ සහයෝගිතාව වර්ධනය කර ගැනීම සහ වැඩිදියුණු කිරීම අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකාවේ සහ පිලිපීනයේ විදේශ සේවා නිලධාරීන් අතර රාජ්‍යතාන්ත්‍රික ක්ෂේත්‍රයේ අධ්‍යයන, පර්යේෂණ හා පුහුණු වැඩසටහන් පැවැත්වීම සහ විශේෂඥතාවන් හුවමාරු කර ගැනීම ආදිය සඳහා පහසුකම් සැලසෙන පරිදි ශ්‍රී ලංකාවේ බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රික පුහුණු ආයතනය සහ පිලිපීන ජනරජයේ විදේශ සේවා ආයතනය අතර අවබෝධතා ගිවිසුමකට එළඹීමට යෝජනා වී ඇත. එකී ගිවිසුම දෙපාර්ශ්වය අතර අත්සන් තැබීම පිණිස විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.



163, කිරුලපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலபன எவனியு, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු தொ T - (+94 11) 2515759
ෆැ பெ F - (+94 11) 2514753
වි மி E - dg@dgi.gov.lk
www.dgi.gov.lk
www.news.lk

**03. අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සම්මුතිය සඳහා වන සංශෝධනයට අදාළ Article 3 bis - සන්ධාන පත්‍රය වෙත ප්‍රවේශ වීම සඳහා වත්මන් අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා දීම**

පියාසර කරමින් තිබෙන සිවිල් ගුවන්යානාවකට එරෙහිව පාර්ශ්වකාර රාජ්‍යයන් විසින් අවි භාවිත කිරීම වැළැක්වීමට හැකි වන පරිදි චිකාගෝ සම්මුතිය සංශෝධනය කිරීම පිණිස 1984-05-10 දින පැවති අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සංවිධානයේ 25 වන මහා මණ්ඩල රැස්වීමේදී තීරණය කරනු ලැබ ඇති අතර, එකී සංශෝධනයට අදාළ සන්ධාන පත්‍රය (Article 3 bis of Chicago Convention) 1998-10-01 වන දින සිට බලාත්මක වී තිබේ. අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සම්මුතියේ පාර්ශ්වකාර රාජ්‍යයක් වශයෙන් එකී සන්ධාන පත්‍රය වෙත ප්‍රවේශ වීම සඳහා 2024-02-12 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇති නමුත්, මෙතෙක් ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කර නොමැත. ඒ අනුව, එකී සන්ධාන පත්‍රයට ප්‍රවේශ වීම සඳහා ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා දෙන ලදී.

**04. ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා කටයුතුවලට අදාළව සිදුවන නීතිවිරෝධී ක්‍රියා මැඩ පැවැත්වීම සඳහා වන සම්මුතිය (බීජිං සම්මුතිය, 2010) මෙරට බලාත්මක කිරීම පිණිස නීති පැනවීම**

මරණයක්, බරපතල ශාරීරික තුවාල කිරීමක් හෝ බරපතල හානියක් සිදු කිරීම සඳහා සිවිල් ගුවන් යානාවක් භාවිත කිරීම, යම් කිසි ජෛව විද්‍යාත්මක, රසායනික හෝ න්‍යෂ්ටික අවියක් හෝ ද්‍රව්‍යයක් මුදාහැරීම සඳහා සිවිල් ගුවන් යානාවක් භාවිත කිරීම, යම් කිසි ජෛව විද්‍යාත්මක, රසායනික හෝ න්‍යෂ්ටික අවියක් හෝ එවැනි සමාන ද්‍රව්‍යයක් ගුවන් යානාවක් තුළ හෝ සිවිල් ගුවන් යානාවකට එරෙහිව භාවිත කිරීම වැනි ක්‍රියාවන් අපරාධ වශයෙන් නම් කරමින් ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා කටයුතුවලට අදාළව සිදුවන නීතිවිරෝධී ක්‍රියා මැඩ පැවැත්වීම සඳහා වන සම්මුතිය (බීජිං සම්මුතිය, 2010) 2010-09-10 දින බීජිංහි පැවති ගුවන් නීතිය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයේදී සම්මත කර ගනු ලැබ ඇත. එවැනි අපරාධ දැනට මෙරට බලාත්මක 1996 අංක 31 දරන ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා කටයුතුවල නිරුපද්‍රිතභාවයට එරෙහි නීතිවිරෝධී ක්‍රියා මැඩ පැවැත්වීමේ පනතේ විධිවිධානවලින් ආවරණය නොවන බැවින්, බීජිං සම්මුතිය බලාත්මක කිරීම පිණිස පනත් කෙටුම්පතක් සකස් කිරීම සඳහා 2022-05-02 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී තිබේ. එකී පනත් කෙටුම්පත සකස් කිරීමේ කටයුතු කඩිනමින් අවසන් කිරීමට හැකි වන පරිදි වත්මන් අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා දීම සඳහා ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

05. ජාත්‍යන්තර කාන්තා දිනය සැමරීමට සමගාමීව "ජාතික කාන්තා සතිය" ප්‍රකාශයට පත් කිරීම

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 1977 වර්ෂයේදී, මාර්තු 08 දින ජාත්‍යන්තර කාන්තා දිනය වශයෙන් ප්‍රකාශයට පත් කර ඇත. එතැන් සිට වර්තමානය දක්වා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සියලුම සාමාජික රටවල් විසින් සෑම වර්ෂයකම මාර්තු 08 දින ජාත්‍යන්තර කාන්තා දිනය ලෙස සමරනු ලැබේ. මෙවර ජාත්‍යන්තර කාන්තා දින සැමරුම "සියලුම කාන්තාවන් සහ ගැහැණු දරුවන් සඳහා: අයිතිවාසිකම්, සමානාත්මතාවය, සවිමත් කිරීම" යන්න තේමාව කරගෙන ඇත. එම දිනයට සමගාමීව "නැගුමට නිරසර මෙටක් - සවිමත් ඇය වේ මගක්" යන්න ප්‍රධාන තේමාව කර ගනිමින් 2025 මාර්තු 02 සිට 08 දක්වා "ජාතික කාන්තා සතිය" වශයෙන් ප්‍රකාශයට පත් කර ජාත්‍යන්තර කාන්තා දින ජාතික සැමරුම ද ඇතුළත්ව ජාතික, පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිණිස කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය විසින් ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

06. ශ්‍රී ලංකා - පාකිස්ථානු රාජ්‍යතාන්ත්‍රික සබඳතා සැමරීම වෙනුවෙන් මුද්දර නිකුත් කිරීම සඳහා ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුව සහ පාකිස්ථානු තැපැල් ආයතනය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම

ශ්‍රී ලංකා - පාකිස්ථානු 75 වසරක දීර්ඝකාලීන සබඳතාව සනිටුහන් කරමින් සමරු මුද්දර 02ක් නිකුත් කිරීමට දෙපාර්ශ්වය අතර එකඟතාවකට පැමිණ ඇත. ඒ අනුව කටයුතු කිරීමට හැකි වන පරිදි දෙරටේ තැපැල් පරිපාලන ආයතන අතර අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබීම සඳහා 2024-10-21 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. යෝජිත අවබෝධතා ගිවිසුමට අනුව දෙරටේ ඓතිහාසික බෞද්ධ සිද්ධස්ථාන පදනම් කර ගනිමින් මුද්දර නිර්මාණය කිරීමට සහ නිකුත් කරනු ලබන මුද්දර 5,000 බැගින් හා මුල් දින කවර 2,000 බැගින් දෙපාර්ශ්වය අතර හුවමාරු කර ගැනීමට ද ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුව සහ පාකිස්ථානු තැපැල් ආයතනය එකඟ වී තිබේ. අදාළ අවබෝධතා ගිවිසුමට මෙතෙක් අත්සන් තබා නොමැති බැවින් ඒ සඳහා වත්මන් අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා ගැනීමටත්, යෝජිත ගිවිසුමට මේ මාසය අවසානයේදී අත්සන් තැබීමටත් සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව සඳහා අමාත්‍ය මණ්ඩලයේ එකඟතාව ලබා දීමට තීරණය කරන ලදී.

07. දිළිඳු බව තුරන් කිරීම සඳහා බහුවිධ ප්‍රවේශ ඇතුළත් ඒකාබද්ධ වැඩසටහනක් වශයෙන් "ප්‍රජා ශක්ති" වැඩසටහන ක්‍රියාත්මක කිරීම

වර්තමාන ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් සෑම පුද්ගලයන් 06 දෙනෙකුගෙන් එක් අයෙකු බහුමාන දරිද්‍රතාවයෙන් පෙළෙන අතර, එම ජනගහනයෙන් 95.3%ක් ග්‍රාමීය හා වතු ආශ්‍රිත ප්‍රදේශවල ජීවත් වේ. ශ්‍රී ලංකාවේ මෙතෙක් ක්‍රියාත්මක කරනු ලැබ ඇති දිළිඳු බව තුරන් කිරීමේ වැඩසටහන් මඟින් ලැබී ඇති අවසන් ප්‍රතිඵල සම්බන්ධයෙන් කිසිදු පාර්ශ්වයක් සෑහීමට පත්ව නොමැති බව ඒ සම්බන්ධයෙන් පළ කරනු ලබන අදහස් දැක්වීම් මඟින් පෙනී යයි. පසුගිය දශක කිහිපය තුළ දිළිඳුකම පිටු දැකීමේ සුබසාධන වැඩසටහන් මඟින් සහන සලසන ලද ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව සහ ඒ සඳහා වැය කරනු ලැබ ඇති මුදල් ප්‍රමාණය ක්‍රමයෙන් ඉහළ ගොස් තිබේ. වසර 2000 වන විට ප්‍රතිලාභී සංඛ්‍යාව මිලියන 1.10ක් වී ඇති අතර, 2010 වර්ෂය වන විට එම සංඛ්‍යාව මිලියන 1.57ක් දක්වා වැඩි වී ඇත. 2024 වර්ෂය වන විට එම සංඛ්‍යාව මිලියන 1.79ක් දක්වා තවදුරටත් වර්ධනය වී තිබේ. මෙම තත්ත්වය දිගින් දිගටම පවත්වාගෙන යාම රටේ ආර්ථික හා නිෂ්පාදන ක්‍රියාවලියට අහිතකර ලෙස බලපාන බැවින්, අවදානම් කණ්ඩායම් පමණක් විධිමත් සමාජ ආරක්ෂණ වැඩපිළිවෙලකට යොමු කර අනෙක් පිරිස ආර්ථික ක්‍රියාවලියේ සක්‍රීය කොටස්කරුවන් ලෙස දායක කර ගනිමින් ක්‍රමවත්ව සැලසුම් කරන ලද වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතුව ඇත. ඒ අනුව, නව රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුගතව 'පොහොසත් රටක් - සුරක්ෂිත ජීවිතයක්' යන දැක්ම සාක්ෂාත් කර ගැනීමට හැකි වන පරිදි බහුවිධ ප්‍රවේශයන් සහිත ඒකාබද්ධ වැඩසටහනක් වශයෙන් "ප්‍රජා ශක්ති" වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිණිස ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

08. කුලියාපිටිය, නාරංගල්ලේ ස්ථාපිත කෙරෙන තාක්ෂණ විෂය ධාරාව සඳහා වූ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ නේවාසිකාගාර ඉදිකිරීම

උසස් පෙළ විෂය ධාරාවට තාක්ෂණවේදය විෂය ධාරාව හඳුන්වා දීමෙන් පසු ඇති වූ ගුරු අවශ්‍යතාව සම්පූර්ණ කිරීමේ අරමුණින් කොරියානු රජයේ ආධාර යටතේ තාක්ෂණවේදය විෂය ධාරාව සඳහා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක් කුලියාපිටිය නාරංගල්ල ප්‍රදේශයේ ස්ථාපිත කිරීමට 2017 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. එකී විද්‍යාපීඨයේ නේවාසිකාගාර සැලසුම් කර ඉදිකිරීම සඳහා විවෘත තරගකාරී ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් සුදුසු කොන්ත්‍රාත්කරුවකු තෝරා ගැනීම සඳහා 2024-03-04 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී තිබේ. ඒ අනුව ලංසු කැඳවා ඇති අතර, ලංසු 12ක් ඉදිරිපත්ව තිබේ. අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය මත පදනම්ව නේවාසිකාගාර ගොඩනැගිලි සැලසුම් කර

ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සාරානුකූලව ප්‍රතිචාර දක්වන ලද අවම ලංසුකරු වන International Construction Consortium (Pvt) Ltd වෙත ප්‍රදානය කිරීම පිණිස අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය වශයෙන් ගරු අග්‍රාමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

09. **ශ්‍රීලන්කන් ගුවන් සේවයේ ගුවන්යානා සඳහා අවශ්‍ය ඉන්ධන සැපයීමේ කොන්ත්‍රාත්තු පිරිනැමීම**

පැරිස්, කැන්ටොන්, ඩකා, ඩුබායි, ගැන් අයිලන්ඩ්, ජෙඩාහ් සහ ඉන්දියාවේ බැංගලෝර්, කොචින්, චෙන්නායි, දිල්ලි, මදුරෙයි, මුම්බායි, තිරුවානන්තපුරම් හා තිරුචිරපල්ලි යන ජාත්‍යන්තර ගුවන්තොටුපොළවලදී ශ්‍රීලන්කන් ගුවන් සේවයේ ගුවන්යානාවලට අවශ්‍ය ඉන්ධන සැපයීමේ කොන්ත්‍රාත්තු පිරිනැමීම සඳහා ජාත්‍යන්තර සීමිත තරගකාරී ලංසු කැඳවා ඇත. ඒ අනුව, ඉහළ මට්ටමේ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ මත පදනම්ව පහත සඳහන් පරිදි වසර දෙකක් (02) කාලසීමාවක් සඳහා අදාළ කොන්ත්‍රාත්තු පිරිනැමීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

| ගුවන්තොටුපොළ | නිර්දේශිත ලංසුකරු |
|---|---|
| පැරිස් | BP Middle East LLC |
| කැන්ටොන් | BP Middle East LLC |
| ඩකා | Aviation Services Management Limited |
| ඩුබායි | Chevron Products Company, A division of Chevron USA INC. |
| ගැන් අයිලන්ඩ් | Royal Sino-Energy Aviation Services Hongkong Company Limited |
| ජෙඩාහ් | United Fuel Company Limited |
| ඉන්දියාවේ ගුවන්තොටුපොළ 07ක | Bharat Petroleum Corporation Limited |

10. සූදු ක්‍රීඩා නියාමනය කිරීමේ අධිකාරිය පිහිටුවීම

ශ්‍රී ලංකාව තුළ ඔට්ටු ඇල්ලීම සහ සූදු ආයතන ප්‍රමිතිකරණය කිරීම, සමාජ හානි අවම කිරීම, සංචාරක ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීම හා ආර්ථික වර්ධනය කිරීම සඳහා පුළුල් හා පූර්ණ විෂය පථයක් සහිත ස්වාධීන නියාමන ආයතනයක් ලෙස සූදු ක්‍රීඩා නියාමනය කිරීමේ අධිකාරිය පිහිටුවීමටත්, ඒ සඳහා පනත් කෙටුම්පත් සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීමටත් 2023-06-26 වන දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. එම පනත් කෙටුම්පත් කිරීමේ කාර්යය අඛණ්ඩව කර ගෙන යාම සඳහා වත්මන් අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්තිමය අනුමැතිය අවශ්‍ය බව නීති කෙටුම්පත් සම්පාදක විසින් දැනුම් දී ඇත. ඒ අනුව, එකී පනත් කෙටුම්පත කඩිනමින් සකස් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා දීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

11. 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත සංශෝධනය කිරීම

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය (SLADA) ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ (WADA) නීති හා රෙගුලාසි මත පදනම්ව ක්‍රියාත්මක වන ආයතනයක් වන අතර, ශ්‍රී ලංකාවේ ක්‍රීඩකයින්ට ජාත්‍යන්තර ක්‍රීඩා තරග නියෝජනය කිරීම සඳහා අවස්ථාව ලබා ගැනීමට නම් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය එකී නීති රෙගුලාසිවලට අනුගතව ක්‍රියාත්මක විය යුතුය. ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් සෑම රටකම උත්තේජක මර්දන නීතිය වරින් වර විමසීමකට ලක් කර එය නියමිත මට්ටමක පවතීදැයි සමාලෝචනය කර, සිදු කළ යුතු සංශෝධන නිර්දේශ කරනු ලබයි. 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත සකස් කිරීමේදී 2013 වර්ෂයේ පැවති අන්තර්ජාතික ප්‍රතිපාදන ඊට අදාළ කර ගෙන ඇත. 2024 වර්ෂය සඳහා ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ශ්‍රී ලංකාවේ උත්තේජක මර්දන නීතිය සමාලෝචනය කිරීමෙන් අනතුරුව එම පනතට සිදු කළ යුතු සංශෝධන ගණනාවක් නිර්දේශ කර තිබේ. ඒ අනුව, 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත සංශෝධනය කිරීම සඳහා පනත් කෙටුම්පතක් සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම පිණිස තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

************